**නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය - 2023**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ (''ආයතනය'') 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.5.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසර 3 කට වැඩි කාලයක සිට පැවත එන රු.3,152,164 ක් වූ ණයගැති ශේෂයන් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ශේෂයෙන් නියෝජනය වන්නේ රාජ්‍ය ආයතන හා පෞද්ගලික සමාගම් වෙත ඉටුකරන ලද සේවා වෙනුවෙන් ලැබිය යුතු මුදල්ය. ඇතැම් රාජ්‍ය ආයතන මේ වන විට මෙහෙයුම් ක්‍රියාකාරීත්වයේ නොමැත. මේ පිළිබඳව නැවත විශ්ලේෂනයක් සිදු කර අයකරගත හැකි ශේෂයන් පිළිබඳව කටයුතු කිරීමට අපේක්ෂිතය. | ණයගැති ශේෂ විශ්ලේෂණය කර අය කර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ආ) | ආයතනය මඟින් බාහිර පාර්ශවයන් සඳහා සිදු කරනු ලබන ව්‍යාපෘති හා පාඨමාලා සඳහා ගාස්තු වෙනුවෙන් 2018 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ලැබිය යුතු රු.2,469,031 ක් අයවී නොතිබුණි. | ඉන්වොයිසිය සඳහා ලැබිය යුතු මුදල් අයකර ගැනීම සඳහා සිහි කැඳවීම් මගින් අදාළ සේවාලාභීන් වෙත දැනුම් දී ඇති අතර හැකි ඉක්මනින් මුදල් අයකර ගැනීම සඳහා කටයුතු කරගෙන යනු ලැබේ. | ලැබිය යුතු ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අදාල වර්ෂය තුළ නිම නොකළ ව්‍යාපෘති ලෙස විලම්බිත ආදායම් ගිණුමේ වසර 3කට වැඩි කාලයක සිට පැවත එන රු. 792,500 ක ශේෂ 10ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම මුදල විලම්බිත ආදායම් ලෙස සටහන් වන අගයක් වන අතර ආයතන හා ව්‍යාපෘති ක්‍රියාත්මක නොවීම මත අයකර ගත නොහැකි වූ, මුදල් ගෙවා අයදුම්කරුවන් සහභාගී නොවූ හා අවලංගු කළ යුතු ඉන්වොයිස් වල ශේෂයන් වේ. | අදාල පාර්ශවයන් විමසා ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (අ) | මුදල් රෙගුලාසි 134(1) | නියෝජ්‍ය අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණක) විසින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ (මූල්‍ය) තනතුරෙහි 2020 වර්ෂයේ සිට වැඩ බැලීම සිදු කරනු ලබයි. එම වැඩ බැලීම අභ්‍යන්තර විගණක තනතුරෙහි ස්වාධීනත්වය කෙරෙහි දැඩි බලපෑමක් ඇතිකරවන කරුණකි. | නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) තනතුරෙහි රාජකාරි ඉටු කිරීම සඳහා ඉක්මන් පියවර ගතයුතු බැවින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත එම තනතුරේ රාජකාරි ඉටු කිරීමට නිලධාරියකු පත්කිරීමට කටයුතු කරන ලදී. ඉදිරියේදී පුවත් පත් දැන්වීම් පල කර බඳවා ගැනීම් කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අභ්‍යන්තර විගණකගේ ස්වාධීනත්වය සුරකීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි 371(2) | තත්කාර්ය අතුරු අග්‍රිම මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් ලබා දිය යුතු වුවත්, මාණ්ඩලික නොවන නිලධාරීන්ට ද අවස්ථා 63 කදී එකතුව රු 2,357,200 ක තත්කාර්ය අතුරු අග්‍රිම ලබා දී තිබුණි. | පවත්නා කාර්යය මණ්ඩලයේ හිඟය, විවිධ අවශ්‍යතා සහ කාර්යය මණ්ඩල වල හදිසි අවශ්‍යතා මත මාණ්ඩලික නොවන නිලධාරීන්ට ද නිකුත් කිරීමට සිදුවී ඇත. කෙසේ වුවද ඉදිරියේදී හැකි සෑම විටම මාණ්ඩලික නිලධාරීන්ට පමණක් අග්‍රිමයන් නිකුත් කිරීමට සටහන් කරගනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව මාණ්ඩලික නිලධාරීන්ට පමණක් අතුරු අග්‍රිම ලබා දිය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | මුදල් රෙගුලාසි 756 (2) (අ) | සමීක්ෂණ මණ්ඩලයේ සංයුතිය දෙදෙනෙකුගෙන් සමන්විත විය යුතු වුවත් ආයතනය එක් සමීක්ෂණ මණ්ඩලයක් සඳහා සංයුතිය 05ක් වන පරිදි පත් කිරීම් සිදු කර තිබුණු අතර 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු වෙනුවෙන් සමාජිකයින් 33 දෙනෙකු සඳහා රු. 416,850 ක් ගෙවීම් කර තිබුණි. | ආයතනික ව්‍යුහය සහ භාණ්ඩවල ස්වභාවය, ධාරිතාවය, තාක්ෂණික අවශ්‍යතා ආදී විවිධ හේතූන් සලකා බලා අවම වශයෙන් පස් දෙනෙකුගෙන් යුත් සමීක්ෂණ මණ්ඩල පත් කරන ලදී. කාර්යය නිසිපරිදි ඉටුකිරීමට පාලක මණ්ඩල අනුමැතිය මත උපරිම දින 21කට යටත්ව දෛනිකව ගෙවීමක් කරනු ලබයි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව සමීක්ෂණ මණ්ඩල පත් කිරීම හා ගෙවීම් කිරීම සිදු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.23,433,105 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.31,554,058 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.8,120,953 ක පිරිහීමක් විය. මෙම පිරිහීමට ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘති ආදායම රු.13,546,295 කින් වැඩි වුවද , පාඨමාලා ආදායම රු.14,443,475 කින් හා රජයේ ප්‍රදාන රු.8,551,600 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමණාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | Tea colour sorting යන්ත්‍රය නිෂ්පාදනය සඳහා රු.13,171,672 ක වියදමක් දරා ඇතත්, ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය Field Programmable Gate තාක්ෂණය නොමැතිවීම හේතුවෙන් වෙළඳපලට එළිදැක්වීමට හා අලෙවි කිරීමට නොහැකිවී තිබීමෙන් වැය කරන ලද මුදල නිශ්ඵල වියදමක් වී තිබුණි. | ව්‍යාපෘතියේ සේවය කළ නිලධාරීන් දිගින් දිගටම ඉවත්වීම නිසා අඛණ්ඩව නව ඉංජිනේරුවන් සහ සහකාර ඉංජිනේරුවන් ව්‍යාපෘතිය සඳහා යෙදවීමට සිදු විය. 2023 වසර අවසන් වන විට උපකරණ පුහුණුව සමග ව්‍යාපෘතිය සම්පූර්ණ කරන ලදී. නිෂ්පාදන වෙළඳපොළට දැමීම සඳහා උනන්දුවක් දක්වන පාර්ශ්වයන් පිළිබඳව සාකච්ඡා කළ යුතුය. | ව්‍යාපෘති නියමිත කාලය තුල නිම කර අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ව්‍යාපෘතිවල ස්වාභාවය අනුව කාලයෙන් කාලයට භාවිතයට ගැනීමේ අවශ්‍යතාවය මත වර්ෂ 05 කට වැඩි කාලයක සිට පවත්වාගෙන එන රු.2,518,049 ක ඉන්වෙන්ට්‍රි අයිතම, | තොග අයිතම වැඩි ප්‍රමාණයක් ඉලෙක්ට්‍රොනික අයිතම වන අතර ඒවා ව්‍යාපෘතිවල ස්වභාවය අනුව කාලයෙන් කාලයට භාවිතයට ගනී. එම තාක්ෂණික සහ ඉලෙක්ට්‍රොනික අයිතම දැනට වෙළඳපොලෙන් මිලට | චලනය නොවන තොගය භාවිතයට ගැනීමට හෝ විශ්ලේෂණයක් සිදු කර අපහරණයට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.199,218ක උපාංග හා රු.1,392,997ක මෙවලම්ද වූ එකතුව රු.4,110,264ක් වටිනා චලනය නොවන තොගය කල් ඉකුත් වීමට පෙර ප්‍රයෝජනවත් කාර්යයකට යෙදවීමට කටයුතු කර නොතිබුණි. | ගැනීමට සිදුවුවහොත් එම මිල මීට වඩා කිහිප ගුණයක් වේ. | |

**3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුස්තකාල ස්වයංක්‍රීයකරණ පද්ධතිය සඳහා මිලදී ගත් රු.1,375,400 ක් වටිනා උපාංග 02 ක් සවි නොකර 2018 වර්ෂයේ සිට ද, 2015 වර්ෂයේ ස්ථාපනය කරන ලද රු. 17,348,222 ක් වටිනා ආලෝක මිනුම් පද්ධතිය 2022 වර්ෂයේ සිට ද නිෂ්කාර්යව පැවතුණි. | පුස්තකාල MIS පද්ධතියේ ක්‍රියාකාරිත්වය ස්වයංක්‍රීය කරණ මොඩියුලය සම්පූර්ණ කිරීමට ඉහත අයිතම භාවිතා කළ අතර මෙම ව්‍යාපෘතිය සම්පූර්ණ වීමට අවශ්‍ය "system firmware" සහ "library database system" සඳහා දේශීය මෘදුකාංග ප්‍රවර්ධකයකු සමඟ සාකච්ජා කළද අරමුදල් සීමාවීම හේතුවෙන් ඉදිරියට යාමට නොහැකි විය. 2015 වර්ෂයේ 15D අංශයේ ස්ථාපිත කල Illumina clus ආලෝක මිනුම් පද්ධතියේ සමහර කොටස් 2022 වසර තුල වරින් වර ක්‍රියා විරහිත විය.මනා ශක්‍යතා අධ්‍යනයකින් පසුව ඉදිරියට ගත යුතු ක්‍රියා මාර්ග සඳහා යෝජනාවක් සහිත වාර්තාවක් 2024 ඉදිරිපත් කර ඇත. | අදාල උපකරණ ඵලදායී අයුරින් ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ආ) | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙනුවෙන් පුරාවිද්‍යා ගවේෂණ හා කැණීම් කටයුතු සඳහා ඡායාරූප ලබාගැනීමේ අරමුණින් 2016 වර්ෂයේදී මිලදී ගෙන තිබූ රු.10,564,677 ක් වූ නියමුවන් රහිත ගුවන්යානයක් ක්‍රියාත්මක කිරීමට රු.110,320 ක්ද වැය කර තිබුණි. ඒ සඳහා අවශ්‍ය පුහුණුව හා පියාසර කිරීමට අවශ්‍ය අවසරය ලබා ගෙන තිබුණ ද මිලදී ගත් දින සිට අදාල කාර්යය සඳහා යොදා නොගෙන නිෂ්කාර්යව පැවතීම මත වැය කරන ලද මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | විවිධ ක්ෂේත්‍රයන්හි සංවර්ධන ව්‍යාපෘති වල චන්ද්‍රිකා ඡායාරූප සඳහා ආදේශකයක් ලෙස ඡායාරූප ලබා ගැනීමට ආරක්ෂක අමාත්‍යාංශය විසින් දෙන ලද උපරිම පියාසර උස මීටර් 150 ක (අඩි 492) අනුමැතිය ට යටත්ව ආනයනය කරන ලදී. උපරිම පියාසර උස මීටර් 60 ක (අඩි 200) සීමා කිරීම නිසා එය අපේක්ෂිත අරමුණ සඳහා භාවිතා කිරීමට නොහැකි විය. 2022 පියාසර උස අඩි 400 ක් ලෙස නව නීති සම්පාදනය කර ඇති අවස්ථාවේ පියාසර සැලසුම් පද්ධතියට අදාල මෘදුකාංගයේ දෝෂයක් හඳුනාගැනීම නිසා අපේක්ෂිත අරමුණ සඳහා භාවිතා කිරීමට නොහැකි විය. | අවශ්‍යතාවය හා අරමුණු ඉටුකර ගැනීමට ඇති හැකියාව පිළිබඳ මනා අධ්‍යනයකින් පසුව භාණ්ඩ මිලදී ගත යුතු අතර මෙම ගුවන්යානය භාවිතා කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |

**3.3 මානව සම්පත් කළමණාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනයේ 177 ක් වන අනුමත කාර්යය මණ්ඩලයෙන් පුරප්පාඩු සංඛ්‍යාව 95 ක් හෙවත් සියයට 54 ක් වූ අතර පුරප්පාඩුවලින් සියයට 56 ක්ම ආයතනයේ ප්‍රධාන කාර්යය සම්බන්ධ තාක්ෂණ ගණයේ පුරප්පාඩු විය. | විවිධ හේතු මත ඉංජිනේරුවන්, විද්‍යාඥයින්, තාක්ෂණ ශිල්පීන් ඉල්ලා අස් වූ අතර ඇතැම් ජ්‍යෙෂ්ඨ තාක්ෂණික නිලධාරීන් විශ්‍රාම යන ලදී. තාක්ෂණික ගණයේ තනතුරු සඳහා පුවත් පත් දැන්වීම් පල කලත් සුදුසුකම් ලත් අයදුම්කරුවන් නොමැතිවීම නිසාත්, 2019 සිට 2024 දක්වා නව බඳවා ගැනීම් නවතා චක්‍රලේඛ නිකුත් කිරීම හේතුවෙනුත් බඳවා ගැනීම් කළ නොහැකි විය. | පුරප්පාඩු අත්‍යවශ්‍ය කාර්ය මණ්ඩලය නොපමාව පුරවා ගැනීමට පියවර ගත යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**4.1 ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ උප ක්‍රියාකාරකම් 11 ක් වර්ෂය තුල දී ඉටු කර නොතිබුණි. තවද සැලසුම් කරන ලද ක්‍රියාකාරකම් 11 ක් අපේක්ෂිත ඉලක්කයන් කරා ළඟා වී නොතිබුණි. | සිදු නොකළ ක්‍රියාකාරකම් 22න්, 05ක් ප්‍රසම්පාදන ද, 17 ක් තාක්ෂණික ව්‍යාපෘති හා පුහුණු වැඩසටහන් ද වේ. ප්‍රාග්ධනය ලැබීමේ සීමා හේතුවෙන් ප්‍රසම්පාදන 05 සම්පූර්ණ කල නොහැකිවී ඇත. ව්‍යාපෘති සහ පුහුණු වැඩසටහන් 17න් 06ක් පමණක් සිදුකිරීමට නොහැකි වූ අතර, 04 ක සැළකිය යුතු ප්‍රගතියක් ලඟාකර ගැනීමටද 07ක තරමක ප්‍රගතියක් ලඟාකර ගැනීමටද හැකි විය. | ප්‍රායෝගික තත්ත්වයන් සළකා බලා ක්‍රියාකාරී සැලැස්ම පිළියල කළ යුතු අතර පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කල යුතුයි. |